ශීර්ෂය 320 - සිවිල් ආරක්ෂක දෙපාර්තමේන්තුව - 2024

1. මූල්‍ය ප්‍රකාශන

1.1 තත්ත්වාගණනය කළ මතය

ශීර්ෂය 320 - සිවිල් ආරක්ෂක දෙපාර්තමේන්තුවේ 2024 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශවලින් සමන්විත 2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව සිවිල් ආරක්ෂක දෙපාර්තමේන්තුවේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් ඇතුළත් සම්පිණ්ඩන වාර්තාව 2025 මැයි 15 දින ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුවට අදාළ වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2025 මැයි 30 දින ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව මෙම වාර්තාව පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, සිවිල් ආරක්ෂක දෙපාර්තමේන්තුවේ 2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශනවලින්, මූල්‍ය තත්ත්වය, මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ, මූල්‍ය ප්‍රකාශන වලට අදාළ සටහන් 1 හි සඳහන් මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේ පදනමට අනුකූලව සියලුම ප්‍රමාණාත්මකතාවයන් සම්බන්ධයෙන් සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ. ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම, විගණකගේ වගකීම යන වගන්තියේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

1.3 කරුණක් අවධාරණය කිරීම - මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේ පදනම

මෙම මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේ පදනම විස්තර කරන මූල්‍ය ප්‍රකාශනවලට අදාල සටහන් 1 කෙරෙහි අවධානය යොමු කරවමි. මූල්‍ය ප්‍රකාශන රජයේ මුදල් රෙගුලාසි 150 හා 151 සහ 2025 පෙබරවාරි 21 දින සංශෝධිත 2024 දෙසැම්බර් 16 දිනැති රාජ්‍ය ගිණුම් මාර්ගෝපදේශ අංක 06/2024 අනුව සිවිල් ආරක්ෂක දෙපාර්තමේන්තුවේ, මහා භාණ්ඩාගාරයේ සහ පාර්ලිමේන්තුවේ අවශ්‍යතාවය සඳහා සකස් කර ඇත. එම නිසා, මෙම මූල්‍ය ප්‍රකාශන වෙනත් අරමුණු සඳහා සුදුසු නොවිය හැක. මගේ වාර්තාව සිවිල් ආරක්ෂක දෙපාර්තමේන්තුව, මහා භාණ්ඩාගාරයේ සහ ශ්‍රී ලංකා පාර්ලිමේන්තුවේ භාවිතය සඳහා පමණක් අරමුණු කර ඇත. මෙම කරුණ සම්බන්ධයෙන් මගේ මතය විකරණය කරනු නොලැබේ.

1.4 මූල්‍ය ප්‍රකාශය සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම

රජයේ මුදල් රෙගුලාසි 150 හා 151 සහ 2025 පෙබරවාරි 21 දින සංශෝධිත 2024 දෙසැම්බර් 16 දිනැති රාජ්‍ය ගිණුම් මාර්ගෝපදේශ අංක 06/2024 අනුකූලව සියලුම ප්‍රමාණාත්මකතාවයන් සම්බන්ධයෙන් සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන

පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුව විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුවේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

1.5 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකාධිපති වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කර ගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති විය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම් හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දූස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගැයීම.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ගණන්දීමේ නිලධාරී දැනුවත් කරන ලදී.

1.6 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

1.6.1 ගිණුම්කරණ අඩුපාඩු

(අ) ආදායම් ලැබීම්

දෙපාර්තමේන්තුවට අදාළ ආදායම් ලැබීම් ගිණුම්ගත කිරීමේදී පහත සඳහන් අඩුපාඩු නිරීක්ෂණය විය.

	විගණන නිරීක්ෂණය	ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
(i)	කෘෂි, සත්ත්ව හා වෙනත්, සංගීත හා නර්තන, ආරක්ෂක සේවා, ඉදිකිරීම් හා නඩත්තු සේවා යන අංශ මගින් දෙපාර්තමේන්තුව වාර්ෂිකව ආදායම් රැස්කරන අතර, එම ආදායම් ප්‍රභවයන්ගෙන් සමාලෝචිත වර්ෂයේදී එකතුව රු. 2,173,717,340 ක ආදායමක් ඉපයූ බව මූල්‍ය ප්‍රකාශන තුල අනාවරණය කර තිබුණි. වාර්ෂිකව උපයනු ලබන මෙම ආදායම් ගිණුම් ගත කිරීමට රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුව විමසා වෙනම ආදායම් ශීර්ෂයක් ලබා ගැනීමට සමාලෝචිත වර්ෂයේදී ද කටයුතු කර නොතිබුණි.	ආදායම් ශීර්ෂයක් අනුමත කිරිමට පෙර දෙපාර්තමේන්තුව වෙනුවෙන් පනතක් සකස් කර ආදායම් ඉපයීම යන කර්තව්‍යය ද ඇතුළත් කර පනත අනුමත කරගත යුතු බව අමාත්‍යංශ විගණන කළමනාකරණ කමිටුවේ දී තීරණය විය. පනත සකස් කිරීමද දෙපාර්තමේන්තුව ප්‍රතිව්‍යුහගත කිරීමේ වැඩපිළිවෙල හේතුවෙන් කඩිනමින් සිදුකිරීමට නොහැකි බව දන්වමි.	ආදායම් සම්බන්ධ ගිණුම් තැබීමේ කාර්යය සඳහා ආදායම් ශීර්ෂයක් ලබා ගැනීමට කටයුතු කළ යුතු වීම.
(ii)	2022 හා 2023 වර්ෂවලදී සහල් අලෙවියෙන් මැදිරිගිරිය බලකාය වෙත රු.575,475 ක් ද, උහන බලකාය වෙත රු.1,200,000 ක් ද, මහඔය බලකාය වෙත රු.1,063,047 ක් ද, වශයෙන් ලැබිය යුතු මුළු මුදල වූ රු.2,838,522 ක් ව්‍යාපෘති අංශය විසින් හඳුනාගෙන වාර්තා කර නොතිබීම හේතුවෙන් 2023 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන තුල ඇතුලත් කර නොතිබූ බැවින් සමාලෝචිත වර්ෂයේදී ද හිඟ ආදායම් වටිනාකම රු.2,838,522 කින් අඩුවෙන් දක්වා තිබුණි.	දෙපාර්තමේන්තු ව්‍යාපෘති වලට ආදාලව හිඟ ආදායම් හඳුනාගෙන වාර්තා කිරීමට උපදෙස් ලබා දී ඇති අතර ඒ අනුව සියළු හිඟහිටි ආදායම් පිලිබඳ සොයාබලා වාර්තාවක් සකස් කිරීමට අවශ්‍ය පියවර ගෙන ඇති අතර එම වාර්තාව සකස් කර පිටපතක් ලබාදීමට කටයුතු කරමි.	මූල්‍ය ප්‍රකාශන තුළ ආදායම් නිවැරදිව වාර්තා කළ යුතු වීම.

(ආ) දේපල පිරියත හා උපකරණ

දේපල පිරියත හා උපකරණ ගිණුම්ගත කිරීමේදී පහත සඳහන් අඩුපාඩු නිරීක්ෂණය විය.

	විගණන නිරීක්ෂණය	ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
(i)	රු.4,500,000ක් වටිනා WPGP-8951 අංක දරන ඩබල් කැබ් රථය මූල්‍ය ප්‍රකාශන තුළ කාර් රථයක් ලෙස සහ ඩබල් කැබ් රථයක් ලෙස දෙවරක් ඇතුලත් කර තිබූ අතර ඒ අනුව එම වටිනාකමින් දේපළ, පිරියත හා උපකරණ	2024/12/31 දින ගිණුම්ගත කරන ලද රු.මි 4.5 ක වටිනාකමින් යුතු WP GP-8951 රථය ද්විගණනය වීමේ දෝෂය සිගාස් පද්ධතිය තුලින් අපහරණය කර එම දෝෂය	දේපළ,පිරියත හා උපකරණ වටිනාකම් නිවැරදිව ගිණුම්ගත කළ යුතු වීම.

	වටිනාකම වැඩියෙන් දක්වා තිබුණි.	නිරාකරණය කර ඇති බව දන්වා සිටිමි.	
(ii)	දෙපාර්තමේන්තුව සතුව පැවති පාපැදි 341 කින් පාපැදි 277 ක වටිනාකම් පමණක් මූල්‍ය ප්‍රකාශනවල ඇතුලත් කර තිබූ අතර පාපැදි 34 ක වටිනාකම් ගිණුම්ගත කර නොතිබුණි.	මෙම පා පැදි අපහරණ ක්‍රියාවලිය සඳහා යොමු කිරීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගන්නා බව දන්වා සිටිමි.	දේපළ පිරියත හා උපකරණ වටිනාකම් නිවැරදිව ගිණුම්ගත කළ යුතු වීම.
(iii)	දෙපාර්තමේන්තුවට අයත් ඉඩම් කැබලි 05 ක තක්සේරු වටිනාකම් එකතුව රු.17,262,500 ක් මූල්‍ය ප්‍රකාශනයේ ACA 6 තුල ඇතුලත් කර නොතිබීම මත සමාලෝචිත වර්ෂයේ මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ දේපළ, පිරියත හා උපකරණ වටිනාකම රු.17,262,500 ක් අඩුවෙන් දක්වා තිබුණි.	2025 පළමු කාර්තුව තුල ගිණුම්ගත කර අවසන් කර ඇත.	දේපළ පිරියත හා උපකරණ වටිනාකම් නිවැරදිව ගිණුම්ගත කළ යුතු වීම.
(iv)	සමාලෝචිත වර්ෂය අවසානය වන විට අයිතිය පවරාගෙන තිබූ හෙක්ටයාර් 10.6313 වපසරියකින් යුත් බිම් කැබලි 20 ක් තක්සේරු කර මූල්‍ය ප්‍රකාශන තුල ඇතුලත් කර නොතිබුණි.	මෙම ඉඩම් තක්සේරු කිරීමට තක්සේරු දෙපාර්තමේන්තුව වෙත ඉල්ලීම් සිදුකර ඇති අතර තක්සේරු වාර්තා ලැබීමෙන් පසු කඩිනමින් ගිණුම්ගත කිරීමට කටයුතු කරමි.	තක්සේරු වාර්තා කඩිනමින් ලබා ගැනීමට කටයුතු කර නිවැරදිව ගිණුම්ගත කළ යුතු වීම.

(ඇ) ලේඛන හා පොත්පත් පවත්වා නොතිබීම

දෙපාර්තමේන්තුව විසින් පහත දැක්වෙන ලේඛන පවත්වා නොතිබුණු අතර, ඇතැම් ලේඛන විධිමත්ව හා යාවත්කාලීනව පවත්වා නොතිබුණු බව නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය විය.

විගණන නිරීක්ෂණය	ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
(i) හානි පිළිබඳ ලේඛනය		
හානි පිළිබඳ ලේඛනය අදාල වටිනාකම් ඇතුලත්ව විස්තරාත්මකව පවත්වාගත යුතු වුවත් පාලන අංශය විසින් පවත්වා ගෙන යනු ලබන හානි පාඩු ලේඛනයෙහි හානියට අදාළ විස්තර සටහන් කිරීමේදී අවිධිමත් ලෙස සටහන් තැබීම්, නිසි අධිකාර බලයක් රහිතව සටහන් සංශෝධන සිදුකිරීම් හා ලේඛනයට ඇතුළත් නොවූ හානි පාඩු පැවතීම යන අඩුපාඩු නිරීක්ෂණය විය.	හානි පාඩු ලේඛනයේ අවිධිමත් ලෙස පැන්සලෙන් සටහන් තැබීම්, නිවැරදිව සටහන් කිරීමත් හා ලේඛණයට ඇතුලත් නොවුනු අඩුපාඩු සම්පූර්ණ කිරීමත් මේවන විට සිදුකරමින් පවතින බවත් 2025 වර්ෂයේ මැයි සිට යාවත්කාලීනව හා විධිමත්ව හානි පාඩු ලේඛණය නඩත්තු කිරීමට කටයුතු කරන බව දන්වමි.	මුදල් රෙගුලාසි 110 හි විධිවිධාන ප්‍රකාර ඒ යටතේ වන ආකෘතිය අනුව හානි පිළිබඳ ලේඛනයක් යාවත්කාලීනව පවත්වා ගත යුතු වීම.

(ii) ණය සහ අත්තිකාරම් ලේඛනය

2017 ජූලි 05 දිනැති අංක 256/2017 දරන රාජ්‍ය ගිණුම් චක්‍රලේඛයේ 05 ඡේදය ප්‍රකාරව දෙපාර්තමේන්තුව විසින් එක් එක් නිලධාරීන් වෙනුවෙන් ආරම්භක ශේෂ සහ ඒ ඒ මාසයේ අවකරණය කර ගන්නා ණය මුදල් ප්‍රමාණයන් හා පොලිය සහ දෙසැම්බර් 31 දිනට ණය මුදලේ තවදුරටත් අයවීමට ඇති ශේෂය දක්වමින් CC – 10 ණය හා අත්තිකාරම් ලේඛනයක් පවත්වා නොතිබුණු අතර, පරිගණක පැතුරුම්පතක් ආධාරයෙන් ණය ශේෂ හා අයකිරීම් සටහන්කර තිබුණි.	මෙම දෙපාර්තමේන්තුවේ සිවිල් ආරක්ෂක සාමාජිකයින් වර්තමානය වන විට 32,000 පමණ සේවයේ යෙදී සිටින අතර, ණය හා අත්තිකාරම් සම්බන්ධව CC 10 ලේඛනය නඩත්තු කිරීම ප්‍රායෝගික නොවේ. එබැවින් පරිගණක පැතුරුම් පතක් අධාරයෙන් CC 10 යාවත්කාලීන කරන බව දන්වා සිටිමි.	2017 ජූලි 05 දිනැති අංක 256/2017 දරන රාජ්‍ය ගිණුම් චක්‍රලේඛයේ 05 ඡේදය ප්‍රකාරව සී.සී.10 ආකෘතිය හා ඒ ආකෘතිය පදනම් කරගෙන ණය හා අත්තිකාරම් ලේඛන පිළියෙල කළ යුතු වීම.

2. වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඇ) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

(අ) මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වන බවට,

(ආ) ඉකුත් වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන පිළිබඳ මා විසින් කර තිබුණු පහත සඳහන් නිර්දේශ ක්‍රියාත්මක කර නොතිබුණි.

ඉකුත් වර්ෂයට අදාළ වාර්තාවේ ඡේද යොමුව	ක්‍රියාත්මක කර නොතිබුණු නිර්දේශය	මෙම වාර්තාවේ ඡේද යොමුව
1.6.2 (අ) (i)	ආදායම් ශීර්ෂයක් ලබා ගැනීමට කටයුතු කළ යුතු වීම.	1.6.1 (අ) (i)
1.6.2. (අ) (ii)	සියළුම ව්‍යාපෘති ආදායම් යාවත්කාලීනව නිවැරදිව ගිණුම්වල හඳුනාගැනීමට කටයුතු කළ යුතු වීම.	1.6.1 (අ) (ii)
1.6.2. (ආ) (ii)	දේපළ පිරියත හා උපකරණවල නිවැරදි වටිනාකම් මූල්‍ය ප්‍රකාශන තුල දැක්විය යුතුවීම.	1.6.1 (ආ) (iii)
1.6.2. (ආ) (iii)	දේපළ පිරියත හා උපකරණ තක්සේරු කර නිවැරදි වටිනාකම් ගිණුම් ගත කළ යුතුවීම.	1.6.1 (ආ)(iv)
1.6.2 (ඇ)	2017 ජූලි 05 දිනැති අංක 256/2017 දරන රාජ්‍ය ගිණුම් චක්‍රලේඛයේ 05 ඡේදය ප්‍රකාරව සී.සී.10 ආකෘතිය හා ඒ ආකෘතිය පදනම් කරගෙන ණය හා අත්තිකාරම් ලේඛන පිළියෙල කළ යුතුය.	1.6.1 (ඇ)(ii)
2.1	හිඟ ආදායම් කඩිනමින් අයකර ගත යුතු වීම.	3.1
2.2 (i)	පිළියෙල කරන ලද ඇස්තමේන්තු අනුව වියදම් හැකිතාක් කළමනාකරණය කර ගත යුතු වීම.	3.2 (අ)
2.2 (ii)	ඇස්තමේන්තු හැකි තාක් නිවැරදිව පිළියෙල කිරීමට කටයුතු කළ යුතු වීම.	3.2 (ආ)
3.3 (අ)	ගිණුම් අංශය හා පාලන අංශයේ තොරතුරු අතර පරස්පරතා ඇති නොවන සේ කටයුතු කළ යුතු වීම.	4.3 (ඇ),(ඉ),(ඊ)

3. මූල්‍ය සමාලෝචනය

3.1 ආදායම් කළමනාකරණය

විගණන නිරීක්ෂණය	ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
සිවිල් ආරක්ෂක දෙපාර්තමේන්තුව වෙනත් රාජ්‍ය හා පෞද්ගලික ආයතනවලට සපයනු ලැබූ ආරක්ෂක හා වෙනත් සේවාවන් ඉටුකර දීම වෙනුවෙන් සමාලෝචිත වර්ෂය අවසන් වන විට රු. 135,854,993 ක හිඟ ආදායම් අයකර ගැනීමට පැවතුණි. ඉන් රු.13,655,053 ක් වූ හිඟ ආදායම් සමාලෝචිත වර්ෂය අවසන් වන විටද අයකර ගැනීමට අපොහොසත්ව වර්ෂ 01 සිට 07 දක්වා වූ කාල පරාසයක් ගෙන තිබුණි.	CML ආයතනය හා විදුලිසංදේශ නියාමන කොමිසම සම්බන්ධව නීතිමය කටයුතු සිදුවන අතර, ඉතිරි ආයතන වෙත හිඟ මුදල් කඩිනමින් නිරවුල් කරන ලෙස ලිඛිතව දැනුවත් කර ඇති අතර, මාස් පතා සිහිකැඳවීම් කර අයකර ගැනීමට කටයුතු කරමි.	අයවීම් ප්‍රමාදව පවතින හිඟ ආදායම් කඩිනමින් අයකර ගැනීමට නීතිමය හා පරිපාලනමය පියවර ගත යුතු වීම.

3.2 වියදම් කළමනාකරණය

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

	විගණන නිරීක්ෂණය	ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	මුදල් රෙගුලාසි 50 ප්‍රකාරව සහේතුකව පූර්වානුමාන කළ හැකි සියළුම සේවාවන් ඇස්තමේන්තුවල ඇතුලත් කර ඇති බවටත් ඒවා මුදල් වර්ෂය තුල ඉටුකල හැකි බවටත් හා ඇස්තමේන්තු හැකිතාක් දුරට සම්පූර්ණයෙන් නිවැරදිව පිළියෙල කර ඇති බවටත් ගණන්දීමේ නිලධාරියා වගබලාගත යුතු වුවද, දෙපාර්තමේන්තුව විසින් සමාලොචිත වර්ෂය සඳහා සකස් කරන ලද ඇස්තමේන්තු වෙනස් කිරීමේ විචලතාවය සියයට 100 සිට සියයට 323 දක්වා වූ පරාසයක් ගෙන තිබුණි.	2025 වර්ෂයේ ඇස්තමේන්තු සකස් කිරීමේදී මෙවැනි අඩුපාඩු අවම කිරීමට හැකිතාක් නිවැරදි පුරෝකථනයන් මත ඇස්තමේන්තු සකස් කර ඉදිරිපත් කිරීමට කටයුතු කර ඇති බව දන්වමි.	පිළියෙල කරන ලද ඇස්තමේන්තු අනුව කටයුතු කිරීමේදී විචලනයන්ගෙන් තොරව හැකිතාක් කළමනාකරණය කර ගත යුතු වීම.
(ආ)	වැය විෂයයන් 18 ක ප්‍රතිපාදනයන්හි ඉතිරිය සියයට 12 ත් සියයට 69 ත් දක්වා වූ පරාසයක පැවති අතර, ඉන් වැය විෂයන් 07 ක ප්‍රතිපාදන අඩු කිරීමෙන් පසු ද ඉතිරි වී තිබුණි. තවද, වැය විෂයන් 04 ක ප්‍රතිපාදන මුදල් රෙගුලාසි 66 මඟින් වැඩි කරගැනීමෙන් පසු ඉතිරි වී තිබුණි.	2025 වර්ෂයේ දෙපාර්තමේන්තුව තුළ ප්‍රතිපාදන අතිරික්තයන් ඇති නොවන පරිදි ප්‍රතිපාදන ප්‍රශස්ථව කළමනාකරණය කිරිමට අවශ්‍ය උපදෙස් ලබාදී ඇති බව දන්වමි.	ඇස්තමේන්තු හැකිතාක් නිවැරදිව පිළියෙල කිරීමට කටයුතු කළ යුතු වීම.

3.3 නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම

නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය වූ නීති, රීති හා රෙගුලාසිවල විධිවිධානවලට අනුකූල නොවූ අවස්ථා පහත විග්‍රහ කර දැක්වේ.

	නිරීක්ෂණය			ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
	නීති,රීති හා රෙගුලාසි වලට යොමුව	වටිනාකම රු.	අනුකූල නොවීම		
(අ)	**2016 දෙසැම්බර් 29 දිනැති අංක 30/2016 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේක 3.1 ඡේදය**	-	සෑම ඉන්ධන පරීක්ෂාවකටම මාස 12 කට පසුව හෝ කිලෝමීටර් 25,000 ක දුරක් ධාවනය කිරීමෙන් පසුව හෝ එන්ජිමෙහි ප්‍රධාන අළුත්වැඩියාවකට පසුව හෝ යන කරුණු අතරින්, මුලින්ම යෙදෙන අවස්ථාවට පසුව නැවත ඉන්ධන පරීක්ෂාවක් කළ යුතු වුවද, දෙපාර්තමේන්තුවේ වාහන 125 කට අදාලව සමාලෝචිත වර්ෂයේ එවැනි ඉන්ධන පරීක්ෂාවක් සිදු කර නොතිබුණි.	දෙපාර්තමේන්තුව සතු ඉන්ධන පරිකෂාව සිදුකල යුතු වාහන සංඛ්‍යාව 413 කි. ඉන් සමාලෝචිත වර්ෂයේ ඉන්ධන පරික්ෂාව සිදුකල වාහන සංඛ්‍යාව 288 ක් වන අතර, ඉතිරි වාහන 125 හි ද ඉන්ධන පරික්ෂාව අදියර වශයෙන් සිදු කරමින් පවතී.	ඉන්ධන දහන පරීක්ෂාව චක්‍රලේඛ ප්‍රකාරව සිදුකර යාවත්කාලීන වූ අගයන් මත ධාවන සටහන් පිළියෙල කළ යුතු වීම.
(ආ)	**2017 අප්‍රේල් 19 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ ලිපි 03/2017 හා 2009 අප්‍රේල් 16 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ**	-	සියලුම රජයේ ආයතනවල ඇඟිලි සලකුණු යන්ත්‍ර භාවිතා කර නිලධරයන්ගේ පැමිණීම හා පිටවීම සනාථ කිරීමට වාර්තා තබා ගැනීමට පියවර ගත යුතු වුවත් නියැදි පරීක්ෂාවේදී අනාවරණය වූ පරිදි නිලධාරීන් 800 ක් සිටින හොරොව්පතාන බලකායේ ඇඟිලි සලකුණු යන්ත්‍රයක් නොතිබූ අතර නිලධාරීන් 813 ක් සිටින කටුනායක බලකායේ ඇඟිලි සලකුණු යන්ත්‍රය ක්‍රියාවිරහිත වී මාස 04 ක් පැවතුණි.	කටුනායක බලකායේ ඇඟිලි සළකුණු යන්ත්‍රයේ අළුත්වැඩියාව නිම වූ පසු කඩිනමින් ස්ථාපනය කරන අතර 2025 වර්ෂය තුල දී හොරොව්පොතාන බලකා මූලස්ථානයේ ඇඟිලි සලකුණු යන්ත්‍රයක් ස්ථාපනය කිරීමට සැලසුම් කර ඇත.	නිලධාරීන්ගේ පැමිණීම හා පිටවීම සම්බන්ධයෙන් චක්‍රලේඛ ප්‍රකාරව ඇඟිලි සලකුණු යන්ත්‍ර භාවිතයට කටයුතු කළ යුතු වීම.
(ඇ)	අමාත්‍ය මණ්ඩල **තීරණ** අංක **IAD/GA15/8/අ**	1,292,760,000	ආගමික සිද්ධස්ථාන ආදියෙහි සුළු හා මධ්‍ය පරිමාණ ඉදිකිරීම් සඳහා	මෙය යුද්ධය පැවති කාලයේදී, එම තර්ජිත ගම්මාන වල	අමාත්‍ය මණ්ඩල තීරණ ප්‍රකාරව නීත්‍යානුකූල

	මා.සංදේශ/2 දරන 2015 පෙබරවාරි 09 දිනැති අමාත්‍ය මණ්ඩල සංදේශයේ 03 ඡේදයේ (01) අනුව හා එම සංදේශයට අදාල අංක අමප/15/0089/610 /003 දරන 2015 මාර්තු 05 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණය		දෙපාර්තමේන්තු ශ්‍රම බලකාය යොදා ගැනීමට නිර්දේශ කර අනුමැතිය ලබාදී තිබුණි. ඊට පටහැනිව දෙපාර්තමේන්තුව විසින් ආගමික ස්ථානවල ආරක්ෂක රාජකාරි සඳහා 370 ක්, සුභ සාධක හා නඩත්තු කටයුතු සඳහා 1,812 ක්,රියදුරු රාජකාරි සඳහා 202 ක් හා වෙනත් රාජකාරි සඳහා 10 ක් ලෙස එකතුව 2,394 ක හට/හටවරියන් පිරිසක් යොදවා 2024 වර්ෂයේදී වැටුප් ලෙස රු.1,292,760,000 ක් වැයකර තිබුණි.	විහාරස්ථාන වලට හට පිරිස් ලබාදීමෙන් ආරම්භ වී ඇති අතර, පසුව ආගමික ස්ථාන විශාල සංඛ්‍යාවකට මෙලෙස ලබා දී ඇත. දීර්ඝකාලීනව සිදු වී ඇති මෙම ක්‍රියාදාමය පිළිබඳව පාර්ලිමේන්තු ගිණුම් කාරක සභාවේ ද සාකච්ඡා කරන ලද නමුත් මෙතෙක් ඒ සම්බන්ධව ගතයුතු ක්‍රියාමාර්ග පිළිබඳව නිශ්චිත උපදෙසක් ලැබී නොමැත. නමුත් ඉදිරියේදී දෙපාර්තමේන්තුවේ ප්‍රතිව්‍යුහගත වැඩපිළිවෙල යටතේ මේ සඳහා පිළිතුරක් අපේක්ෂාවෙන් සිටී.	අනුමැතිය යටතේ පමණක් ආගමික ස්ථාන වෙත හටයින්/හටවරියන් අනුයුක්ත කිරීමට කටයුතු කළ යුතු වීම.
(ඇ)	**අමාත්‍ය මණ්ඩල තීරණ අංක IAD/GA15/8/අමා.සංදේශ/2 දරන 2015 පෙබරවාරි 09 දිනැති අමාත්‍ය මණ්ඩල සංදේශයේ 03 ඡේදයේ (01) අනුව හා එම සංදේශයට අදාල අංක අමප/15/0089/610 /003 දරන 2015 මාර්තු 05 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණය**	727,920,000	නෛතික ප්‍රතිපාදනයක් නොමැතිව දෙපාර්තමේන්තුවේ සේවය කරන හට/ හටවරියන් 4,044 ප්‍රමාණයක් 2024/2025 මහ කන්නයේ අඳ වී ගොවිතැන් කටයුතු සඳහා මාස 04 ක කාලයක් සඳහා මුදාහැර තිබුණි. මෙම කාලපරිච්ඡේදයට අදාලව මෙම හට/ හටවරියන්හට වැටුප් ලෙස රු.727,920,000 ක පමණ මුදලක් වැයකර තිබුණි.	පෙර වර්ෂවලද අඳ වී ව්‍යාපෘති සිදුකරන ලද අතර, හට/හටවරියන් ඌණ උපයෝජිතව බලකා තුල සිටීමට වඩා මෙවැනි ව්‍යාපෘතිවල යෙදවීමෙන් ආදායමක් ඉපයීමට හැකිවීම ඵලදායී වේ. කෘෂි ව්‍යාපෘති හා අඳ ව්‍යාපෘති සම්බන්ධව ප්‍රතිපත්තිමය තීරණයක් ගැනීමට අමාත්‍යාංශය කමිටුවක් පත් කිරීමට තීරණය කර ඇති අතර ලද සියළුම ආදායම් ඒකාබද්ධ අරමුදල වෙත බැරකර ඇත.	නෛතික ප්‍රතිපාදන ලබා ගත යුතු වීම.

3.4 අවිධිමත් ගනුදෙනු

(i) අධිකාර බලය නොමැති ගෙවීම්

දෙපාර්තමේන්තුව විසින් අධිකාරී බලය නොමැතිව පහත සඳහන් ගෙවීම් කර තිබුණි.

	විගණන නිරීක්ෂණය	ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	අංක PG - 0423 දරන රථය 2024 ජුනි 18 දින එන්ජින් පද්ධතියේ දෝෂයක් නිසා අලුත්වැඩියා කිරීමට පුද්ගලික ගරාජයක් වෙත යොමුකර රථයේ කොටස් ගැලවීම හා වෙනස් කිරීම් සිදුකර තිබුණද, එයට විධිමත් අවසරයක් හා තාක්ෂණික නිලධාරියෙකුගේ අධීක්ෂණයක් රහිතව සිදුකර තිබුණි.	අධික ලෙස ලිහිසි තෙල් දහනය වීම හා හෙඩ් එකෙන් අනිසි ශබ්දයක් ඇතිවීම හේතුවෙන් PG – 0423 වාහනය ගරාජයකට යොමුකර පරීක්ෂා කරන ලද අතර එය අභ්‍යන්තර දෝෂයක් බැවින් දෝෂය හඳුනාගැනීමට වාහනය ගලවා පරීක්ෂා කර ඇත. මුදල් රෙගුලාසි 103 හා 104 යටතේ පරීක්ෂණයක් සිදුකිරීමට කටයුතු කරන බව දන්වමි.	රජයේ වාහන අළුත්වැඩියා කිරීමේදී නිසි අනුමැතියක් හා අධීක්ෂණයක් යටතේ අළුත්වැඩියාවන් කිරීමට කටයුතු කළ යුතු වීම.
(ආ)	PG – 0425 වැන් රථයේ එන්ජින් පද්ධතියේ අලුත්වැඩියාවක් 2023 දෙසැම්බර් මස සිදුකිරීමෙන් පසු, කිලෝ මීටර් 1,896 ක් පමණක් ධාවනය කර තිබියදී එන්ජින් පද්ධතිය මුළුමනින්ම හානියට පත්වීම මත 2024 අගෝස්තු මස ධාවනයෙන් ඉවත් කර තිබුණි. පළමු අළුත්වැඩියාවේදී යොදන ලද අමතර කොටස් පිළිබඳ කිසිදු පරීක්ෂාවක් සිදුව නොතිබූ අතර එම කොටස් හානියට පත්වීම මත නැවත එන්ජින් පද්ධතිය අළුත්වැඩියා කිරීම සඳහා රු.1,711,315 ක ඇස්තමේන්තුවක් ඉදිරිපත් කර තිබුණි. මෙම තත්ත්වයට වගකිව යුතු නිලධාරීන් හඳුනාගැනීමට කටයුතු කර නොතිබුණි.	මුදල් රෙගුලාසි 104(3) හා මුදල් රෙගුලාසි 104 (4) පරීක්ෂණ කටයුතු අවසන් කර කඩිනමින් පරීක්ෂණ වාර්තා ලබා දීමට උපදෙස් ලබා දී ඇති බව දන්වමි.	වාහන අළුත්වැඩියා කටයුතු නිසි අධීක්ෂණයකින් යුතුව සිදු කළ යුතු වීම හා වගකිවයුතු නිලධාරීන් හඳුනාගතයුතු වීම.
(ඇ)	2024 ජූලි 19 දිනැති සිආදෙ/ආර්ජේඩී/ප්‍රවා/තාගො/01(08) මණ්ඩල වාර්තාව අනුව අංක 65 – 4873 දරන රථයේ අදාළ අලුත්වැඩියා නිවැරදිව කර ඇති බවට සඳහන් කර තිබූ අතර, එය පදනම් කරගෙන රු.2,159,975 ක මුදලක් 2024 ඔක්තෝබර් 14 දින ගෙවා තිබුණි. නැවත මෙම රථයේ දෝෂ සහිත තත්ත්වයක් මත 2024 නොවැම්බර් 14 දින ගරාජය වෙත යොමු කර තිබූ අතර රථය නියමිත පරිදි අලුත්වැඩියා කර ඇති බවට පරීක්ෂා නොකර ඉදිරිපත් කරන ලද අසම්පූර්ණ මණ්ඩල වාර්තාව මත ඉහත මුදල ගෙවා තිබුණි.	මෙම වාහනය කඩිනමින් අලුත්වැඩියා කර ආපසු ලබා ගැනිමටත්, අළුත්වැඩියාව නිමකල දිනයේ සිට නැවත ඉදිරියට වසරක වගකීම් කාලයක් ලබාගැනිමටත්, ප්‍රවාහන අංශයට උපදෙස් ලබාදෙන ලදි. මේ වන විට අළුත්වැඩියා ආයතනයේ නියෝජිතයන් ගෙන්වා සාකච්ඡා කර ඇති අතර ඒ අනුව මෙම වාහනය කඩිනමින් අලුත්වැඩියා කර ලබා ගැනිමට කටයුතු කරන බව දන්වමි.	වාහන අළුත්වැඩියා සඳහා ගෙවීම් කිරීමේදී වාහනයේ අළුත්වැඩියාව නිසි පරිදි සිදු කර ඇති බවට තාක්ෂණික දැනුම ඇති නිලධාරියෙකුගේ සහතිකයක් ලබා ගත යුතු වීම.

(ඇ)	අංක GD – 7248 දරන ජීප් රථය එන්ජිම සම්පූර්ණයෙන් අළුත්වැඩියා කිරීමට නිර්දේශකර තිබියදී එම අළුත්වැඩියාව සිදුනොකර මාස 08 ක් තුල කිලෝ මීටර් 693 ක් ධාවනය කර තිබූ අතර, ධාවනයේදී සිසිලන පද්ධතියේ ඇතිවූ දෝෂයක් හේතුවෙන් එන්ජිම ක්‍රියාවිරහිත වී තිබුණි. රථය අළුත්වැඩියා කිරීමට රු.997,300 ක් වැයකර තිබූ නමුත් අපරීක්ෂාකාරී ලෙස රිය ධාවනයට එක් කිරීම සම්බන්ධයෙන් වගකිවයුතු පාර්ශවයන් හඳුනාගෙන නොතිබුණි.	මේ සම්බන්ධව මණ්ඩලයක් පත් කර ඉදිරි ක්‍රියාමාර්ග ගැනීමට කටයුතු කරමින් පවතී.	වාහන අළුත්වැඩියාව සහ වාහන නඩත්තුවට අදාළ නිලධාරීන් සිය රාජකාරි වගකීම් නිසි ලෙස ඉටු කරන බවට වග බලා ගත යුතු වීම.
(ඉ)	2015 වර්ෂයේ සිට 2021 වර්ෂය දක්වා දෙපාර්තමේන්තුව විසින් මිය ගිය නිලධාරීන් 30 කට හා විශ්‍රාම ගිය නිලධාරීන් 24 කට වැඩිපුර ගෙවා තිබූ වැටුප් රු.626,027 ක් හා එම කාලය තුලදී සේවය හැර ගිය නිලධාරීන් 45 කට වැඩිපුර ගෙවා තිබූ රු.1,281,196 ක් වූ වැටුප් සමාලෝචිත වර්ෂය අවසන් වන විටද අයකර ගෙන නොතිබුණි.	මිය ගිය හා විශ්‍රාම ගිය නිළධාරීන්ගෙන් අයවිය යුතු ශේෂයන් විශ්‍රාම පාරිතෝෂිතයෙන් අය කිරීමට විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුවට දැනුම් දී ඇති අතර, සේවය අතහැර ගිය නිළධාරින්ගෙන් අයවිය යුතු ශේෂයන් පිළිබඳව අදාල නිළධාරීන්ට ලිපි මගින් දැනුවත් කර ඇති අතර, ඔවුන්ගේ යහසාධක අරමුදල් පවතීනම් ඒවායින් අයකර ගැනීමට පවතී.	වැටුප් ගෙවීම සම්බන්ධයෙන් අභ්‍යන්තර පාලනය ශක්තිමත් කළ යුතු වීම සහ වැඩියෙන් ගෙවන ලද වැටුප් කඩිනමින් අයකර ගැනීමට කටයුතු කළ යුතු වීම.

3.5 වංචනික ස්වරූපයේ ගනුදෙනු

නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය වූ වංචනික ස්වරූපයේ ගනුදෙනු පිළිබඳ විස්තර පහත දැක්වේ.

	විගණන නිරීක්ෂණය	ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	යුධ හමුදාවේ නිලධාරීන් දෙදෙනෙකුට, යුධ හමුදාවෙන් ඉන්ධන හා රියදුරු සමඟ වාහන ලබාදී තිබියදී ජාතික අයවැය දෙපාර්තමේන්තුවේ උපදෙස් වලට පටහැනිව දෙපාර්තමේන්තුව විසින්ද ඉන්ධන හා රියදුරු සමඟ වාහන නීත්‍යානුකූල නොවන ලෙස ලබා දීම නිසා 2024 ජූලි සිට සැප්තැම්බර් දක්වා මාස 03 තුලදී පමණක් රු.287,473 ක් හා රු.913,767 ක් වශයෙන් එම නිලධාරීන් දෙදෙනා වෙනුවෙන් වැයකර තිබුණි.	විගණන විමසුම සම්බන්ධව ගතයුතු ක්‍රියාමාර්ග පිළිබඳව අමාත්‍යාංශ විගණන හා කළමනාකරණ කමිටු රැස්වීමේ දී සාකච්ඡා කල අතර, අමාත්‍යාංශය මගින් මණ්ඩලයක් පත් කිරීමට තීරණය කරන ලද බව කාරුණිකව දන්වා සිටිමි.	නිල වාහන ලබා දී තිබිය දී චක්‍රලේඛ වලට පටහැනිව නැවත වාහන එම නිලධාරීන්ට ලබා නොදිය යුතු වීම.
(ආ)	නීතිමය ප්‍රතිපාදන නොතිබියදී නිලධාරියෙක් ගාල්ල ප්‍රදේශයේ නිවසට යාමට ගමන්වාර 27 ක් සඳහා රු.115,875 ක් වූ ඉන්ධන ලීටර් 375 ක් වැයකර තිබුණි. එමෙන්ම තවත් නිලධාරියෙක්ට ලබා දී තිබූ රථයක ධාවන සටහන් පරීක්ෂාවේදී	විගණන විමසුම සම්බන්ධව ගතයුතු ක්‍රියාමාර්ග පිළිබඳව අමාත්‍යාංශ විගණන හා කළමනාකරණ කමිටු රැස්වීමේ දී සාකච්ඡා කල අතර,	නිල වාහන ලබා දී තිබිය දී චක්‍රලේඛ වලට පටහැනිව නැවත වාහන එම නිලධාරීන්ට ලබා

එහි සඳහන් ස්ථාන වෙත නිලධාරියා ගමන්කර ඇති බවට විගණනයට තහවුරු නොවීය.	අමාත්‍යාංශය මගින් මණ්ඩලයක් පත් කිරීමට තීරණය කරන ලද බව කාරුණිකව දන්වා සිටිමි.	නොදිය යුතු වීම.

3.6 අත්තිකාරම් නිකුත් කිරීම් හා පියවීම

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

	විගණන නිරීක්ෂණය	ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	2020 අගෝස්තු 28 දිනැති රාජ්‍ය මුදල් චක්‍රලේඛ අංක 01/2020 හි 9.1 මගින් සංශෝධනය කරන ලද මුදල් රෙගුලාසි 371(2) (ආ) සහ 371(5) අනුව කිසියම් විශේෂිත කාර්යයකට ලබාදුන් අතුරු අග්‍රිමයක් එම කාර්ය නිමකල විගසම හෝ අදාල කාර්යය නිම කර දින 10 ක් ඇතුලත නැවත පියවිය යුතු වුවද, සමාලෝචිත වර්ෂයේ ජනවාරි සිට දෙසැම්බර් 31 දක්වා අවස්ථා 41 කදී ලබාදී තිබූ එකතුව රු.1,622,334 ක් වූ අත්තිකාරම් දින 14 සිට දින 346 දක්වා වූ ප්‍රමාදයකින් යුතුව පියවා තිබුණි.	ලබා ගත් අත්තිකාරම් දින 10 ක් ඇතුළත නැවත පියවිය යුතු බව දන්වා අදාල අය වෙත දැනුම් දීම් සිදුකර තිබුණි. නැවත ප්‍රමාද වීම් සිදුනොවීමට කටයුතු කිරීමට සටහන් කර ගතිමි. මේ පිළිබඳව කළමණාකරන විගණන කමිටුවේදී සාකච්ඡා කර තවදුරටත්, අභ්‍යන්තර පාලනයන් ශක්තිමත් කිරීමට කටයුතු කරන බව දන්වමි.	චක්‍රලේඛ ප්‍රකාරව නියමිත කාලය තුල අත්තිකාරම් පියවීමට කටයුතු කළ යුතු වීම.
(ආ)	සමාලෝචිත වර්ෂයේ ජනවාරි 30 දින නියෝජ්‍ය අධ්‍යක්ෂ (ප්‍රසම්පාදන) වෙත රු.75,000 ක් අත්තිකාරම් ලෙස ලබා දී තිබියදී එය පියවීමට පෙර නැවතත් පෙබරවාරි 02 දින එම නිලධාරියාටම රු.100,000 ක් අත්තිකාරම් ලෙස ලබා දී තිබූ අතර, ඒ අනුව එම නිලධාරියා අත එම කාලපරිච්ඡේදය තුල මුදල් රෙගුලාසි වලට පටහැනිව රු.175,000 ක් පැවතුණි.	අත්තිකාරම් සම්බන්ධව මුදල් රෙගුලාසිවලට අනුව විධිමත් අභ්‍යන්තර පාලන ක්‍රමවේදයක් 2025 මැයි සිට ස්ථාපනය කිරීමට කටයුතු යොදා ඇති අතර එහි ප්‍රගතිය දෙපාර්තමේන්තු විගණන හා කළමනාකරණ කමිටු රැස්වීමේ දී සාකච්ඡා කිරීමට අපේක්ෂා කෙරේ.	අත්‍යවශ්‍ය අවස්ථාවලදී පමණක් සීමා උල්ලංඝණය නොවන පරිදි අත්තිකාරම් ලබා දීමට කටයුතු කළ යුතු වීම.

4. මෙහෙයුම් සමාලෝචනය

4.1 වාර්ෂික කාර්යසාධන වාර්තාව

2024 අංක 44 දරන රාජ්‍ය මූල්‍ය කළමනාකරණ පනතේ 47(4) උපවගන්තිය ප්‍රකාර වාර්ෂික කාර්යසාධන වාර්තාව මුදල් වර්ෂය අවසාන වී දින 180 ක් හෝ ඊට පෙර ප්‍රකාශයට පත් කළ යුතුය. 2020 අගෝස්තු 28 දිනැති අංක 2/2020 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 10.2 ඡේදය ප්‍රකාරව රාජ්‍ය මුදල් දෙපාර්තමේන්තුව විසින් නිකුත් කරන කළ මාර්ගෝපදේශ අංක 14 හි සඳහන් ආකෘතිය ප්‍රකාරව වාර්ෂික කාර්යසාධන වාර්තාව පිළියෙල කළ යුතුව තිබුණි. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(2) වගන්තිය ප්‍රකාරව මෙම කාර්යසාධන වාර්තාව වාර්ෂික මූල්‍ය ප්‍රකාශන සමඟ විගණනයට ඉදිරිපත් කළ යුතුව ඇත. ඒ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

විගණන නිරීක්ෂණය	ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
2024 වර්ෂය සඳහා පිළියෙල කරන ලද කෙටුම්පත් කාර්යසාධන වාර්තාවේ "අංක 1462/20 හා 2006.09.13 දිනැති අති විශේෂ ගැසට් පත්‍රයෙන් සහ 2015 මාර්තු 05 දිනැති අංක අමප/15/0089/610/003 දරන අමාත්‍ය මණ්ඩල පත්‍රිකාව මඟින් රජය විසින් පවරා ඇති අමතර කාර්යයන් ලෙස දිවයින පුරා වී, ධාන්‍ය, එළවළු, පලතුරු ආදී විවිධ මහා පරිමාණ ව්‍යාපෘති මඟින් රටේ ජාතික ආහාර නිෂ්පාදන ශක්තිමත් කිරීම, අඩු පහසුකම් සහිත දුෂ්කර ප්‍රදේශයන්හි පිහිටුවා ඇති මුල් ළමාවිය සංවර්ධන මධ්‍යස්ථාන මඟින් ළමා පරපුරක් බිහි කිරීමට සහාය වීම, ගුරු හිඟය පවතින දුෂ්කර පාසල් සඳහා ස්වේච්ඡා පදනමින් ගුරුවරු ලබා දීම සහ උතුරු සහ උතුරුමැද ප්‍රදේශ ආවරණය වන පරිදි විශාල ප්‍රමාණයේ ජල පෙරණ යන්ත්‍ර ස්ථාපනය කිරීම හා නඩත්තු කිරීම" දක්වා තිබුණ ද, උක්ත ගැසට් පත්‍රය සහ අමාත්‍ය මණ්ඩල පත්‍රිකාව තුල එම කාර්යයන් ඇතුලත්ව නොතිබුණි.	විගණන කළමණාකරන කමිටු තීරණ ප්‍රකාරව වර්තමානය වන විට අමාත්‍යාංශය මඟින් දෙපාර්තමේන්තුවේ ගැටළු විසඳීමට කමිටුවක් පත් කිරීමට කටයුතු කර ඇති බැවින්, එම කමිටුව හරහා දෙපාර්තමේන්තුවේ විෂය පථය නිගමනය කරගැනීමට අපේක්ෂිත බව දන්වමි.	කාර්යසාධන වාර්තාවේ දෙපාර්තමේන්තුවේ කාර්යයන් දැක්වීමේදී නිවැරදි තොරතුරු ඇතුළත් කළ යුතු වීම.

4.2 ප්‍රසම්පාදනයන්

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

	විගණන නිරීක්ෂණය	ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	අංක 63 – 4945 දරන බස් රථය අලුත්වැඩියාවට අදාළව ඇස්තමේන්තු පිළියෙල කිරීම හා මිළ ගණන් ඉදිරිපත්වීම විශ්ලේෂණාත්මකව බැලූ විට ෂීට් කවර දැමීම හා අලුත්වැඩියා කිරීම මෙම ප්‍රසම්පාදනයේ විශේෂිත කරුණු වන අතර, එම කාර්යයන් වෙන වෙනම ඒ සඳහා විශේෂිත වූ ආයතන වලින් කරගත යුතු වුවද ඊට ගැපපෙන ලෙස පිරිවිතර සකසා මිල ගණන් කැඳවා නොතිබුණි.	ඉදිරියේ දී විශේෂිත අළුත්වැඩියාවන් වෙන් කර මිල ගණන් කැඳවීමට හා මෙවැනි අළුත්වැඩියාවන් සඳහා වන තාක්ෂණික ඇගයුම් කමිටු සඳහා අදාල ක්ෂේත්‍රය සම්බන්ධයෙන් දැනුම ඇති නිළධාරියෙකු නම් කිරීමට ප්‍රවාහන අංශයට අවශ්‍ය උපදෙස් ලබා දෙන ලදී.	අළුත්වැඩියාවන් නිසි පරිදි හඳුනා ගෙන අවශ්‍ය පිරිවිතර සකසා ප්‍රසම්පාදන කටයුතු සිදු කිරීමට වග බලා ගත යුතු වීම.
(ආ)	සමාලෝචිත වර්ෂයේ රු.1,964,409 ක් වැය කර මෙට්ට 190 ක් මිලදී ගැනීමේදී ඒ සඳහා 2024 ජනවාරි 17 දින තාක්ෂණික ඇගයීම් කමිටුව පත්කර 6x3x4 ප්‍රමාණයේ ඩබල් ලේයර් මෙට්ට 220 ක් මිලදී ගැනීමට අවශ්‍ය	තාක්ෂණික ඇගයීම් කමිටු සඳහා නියමිත කාල රාමුව තුල කටයුතු කිරීම සඳහා උපදෙස් ලබා දී ඇති අතර, ඇගයුම් වාර්තාව ප්‍රසම්පාදන මාර්ගෝපදේශ	අප්‍රමාදව පිරිවිතර පිළියෙල කර ඉදිරිපත් කිරීමත් ඇගයීම් වාර්තා සම්පූර්ණව හා නිවැරදිව ඉදිරිපත් කිරීමටත් ප්‍රසම්පාදන

	පිරිවිතරයන් සහ අවශ්‍යතා හඳුනාගෙන 2022 ජනවාරි 22 දිනට පෙර ඉදිරිපත් කිරීමට පවරා තිබුණද නියමිත දිනට පිරිවිතර ලබා දී නොතිබුණි තවද, 2024 අගෝස්තු 12 දින ලබා දී තිබූ තාක්ෂණික ඇගයීම් කමිටු වාර්තාවෙහි ප්‍රසම්පාදන අත්පොතෙහි 7.11.1 හි “ලංසු ඇගයීමේ වාර්තාව” අනුව සියලු ලංසුකරුවන්ට, තාක්ෂණික පිරිවිතරයන්ගේ ප්‍රධාන ප්‍රතිපාදනවලට ලංසුකරුවන්ගේ අනුකූලතාවය පෙන්නුම් කරන වගුවක් ඇතුලත් කර නොතිබුණි.	සංග්‍රහයේ නියමයන්ට අනුකූලව සකස්කර ඉදිරිපත් කිරීම පිළිබඳ උපදෙස්, තාක්ෂණික කමිටු පත් කරන අවස්ථාවේ දී ලබාදීමට වර්තමානය වන විට ක්‍රියාකර ඇති බව දන්වමි.	මාර්ගෝපදේශ ප්‍රකාරව කටයුතු කිරීමත් කළ යුතු වීම.
(ඇ)	රු.12,282,200 ක් වැය කරමින් කොළ පැහැති මේස් කුට්ටම් 20,000 ක් මිලදී ගැනීමේදී ලංසු ආරාධනයේ මේස් ජෝඩු 35,000 ක් සඳහා මිල ගණන් කැඳවා තිබුණද, අවශ්‍යතාවය පිළිබඳ නිවැරදි ඇස්තමේන්තුවක් නොතිබීම මත මේස් ජෝඩු 20,000 ක් පමණක් මිලදී ගෙන තිබුණි. තවද , නිර්දේශ සඳහා ප්‍රසම්පාදන කමිටුවේ එක් සාමාජිකයෙකු එකඟවේද, නොවේද යන්න දක්වා නොතිබීම, පරීක්ෂාව සඳහා ආදර්ශක ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනයට ලබාදීමට මාස 03 කට අධික කාලයක් ගැනීම, ලංසු ඇගයීම සඳහා සති 26 කට අධික කාලයක් ගැනීම, ප්‍රසම්පාදන කමිටුව විසින් 2023 දෙසැම්බර් 08 දින රු.11,970,000 කට මිලදී ගැනීමට තීරණය කරන අවස්ථාවේ එකතු කළ අගය මත බදු ප්‍රතිශතය සියයට 18 දක්වා ඉහළ ගොස් තිබීම මත රු.312,261 ක අතිරේක මුදලක් බදු ලෙස ගෙවීමට සිදු වීම වැනි ප්‍රසම්පාදන දුර්වලතා පැවතුණි.	ආයතනික ප්‍රමාද දෝෂ වලක්වාගෙන ඉදිරියේදී මෙවැනි නිරීක්ෂණ නැවත ඇති නොවීමට පාලනයක් යොදා ඇති බව කාරුණිකව දන්වමි. ඒ අනුව කාලසටහනකට අනුව කාලය කළමනාකරණය කර ගනිමින් කටයුතු කිරීමට අපේක්ෂිත බව සඳහන් කරමි.	ප්‍රසම්පාදන මාර්ගෝපදේශ ප්‍රකාරව ප්‍රසම්පාදනයට පෙර අවශ්‍යතා නිසි පරිදි හඳුනා ගත යුතු වීම, තීරණ සඳහා ප්‍රසම්පාදන කමිටුවේ සියලු සාමාජිකයන්ගේ නිර්දේශ ලබා දිය යුතු වීම හා අප්‍රමාදව කමිටු වාර්තා ඉදිරිපත් කිරීම සිදුකළ යුතු වීම.
(ඈ)	වෙන්නවත්ත බලකායේ ගොඩනැල්ල අළුත්වැඩියා කිරීම සඳහා රු.1,094,779 ක් වැය කර තිබූ නමුත් එම ප්‍රසම්පාදනයේදී තාක්ෂණික ඇගයීම් කමිටු වාර්තාවේ එක් සාමාජිකයෙකු අත්සන් තබා නොතිබුණි. තවද, 2024 ජනවාරි 11 දින ප්‍රසම්පාදන කමිටුව විසින් තීරණය ලබාදී තිබුණ ද, කමිටුවේ සාමාජිකයන් දෙදෙනෙකු එම ප්‍රසම්පාදනය සඳහා එකඟ වේ ද	විගණනය විසින් නිරික්ෂණය කරන ලද CSD/LOG/B/346/2023 ගොනුවේ තාක්ෂණික ඇගයීම් කමිටු වාර්තාව සඳහා එක් සාමාජිකයෙකු ගේ අත්සන ලබා ගැනිමට අතපසු වි ඇති අතර එය කඩිනමින් නිවැරදි කිරීමට උපදෙස් ලබා දි ඇති බව	ප්‍රසම්පාදන කාර්ය සංග්‍රහයට අනුව තාක්ෂණික ඇගයීම් කමිටු හා ප්‍රසම්පාදන කමිටු සාමාජිකයන් සිය අත්සන යොදා කමිටු තීරණ ඉදිරිපත් කිරීමට කටයුතු කළ යුතු වීම.

නොවේ ද යන්න සඳහන් කර දන්වමි. නොතිබුණි. ඒ අනුව නිසි අනුමැතින් නොමැති ප්‍රසම්පාදනයක් සඳහා ඉහත සඳහන් මුදල ගෙවා තිබුණි.

4.3 වත්කම් කළමනාකරණය

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

	විගණන නිරීක්ෂණය	ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	මූල්‍ය ප්‍රකාශන අනුව වාහන හා උපකරණ 574 ක් පැවති අතර ප්‍රවාහන අංශයේ උපලේඛන අනුව වාහන හා උපකරණ 32 ක් අඩුවෙන් එනම් 544 ක් පමණක් පැවතුණි. තවද, මූල්‍ය ප්‍රකාශන තුල ඇතුලත් කර තිබූ රු.28,058,975 ක් වටිනා වාහන 60 ක් ප්‍රවාහන අංශයේ උපලේඛන තුල ඇතුලත්ව නොතිබූ අතර ප්‍රවාහන අංශයේ උපලේඛන අනුව පැවති වාහන 17 ක් මූල්‍ය ප්‍රකාශන තුළ ඇතුළත්ව නොතිබුණි.	රථවාහන 16 දෙපාර්තමේන්තුව වෙත 2024/12/31 වන දින වන විට හිමිකාරීත්වය පවරාගෙන නොතිබීම හේතුවෙන් මූල්‍ය ප්‍රකාශන තුල ගිණුම්ගත කර නොමැති බව දන්වමි.	මූල්‍ය ප්‍රකාශන හා උප ලේඛන අතර පවතින පරස්පරතා හඳුනා ගෙන නිවැරදි කලයුතු අතර දෙපාර්තමේන්තුව භාවිතා කරන පවරා නොගත් වාහනවල අයිතිය කඩිනමින් පවරා ගෙන ගිණුම් ගත කිරීමට කටයුතු කළ යුතු වීම.
(ආ)	ප්‍රවාහන අංශය හා ගිණුම් අංශ යන අංශ දෙකෙහිම වාර්තා තුල ඇතුලත් නොවූ සිවිල් ආරක්ෂක දෙපාර්තමේන්තුව නමින් මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුවේ ලියාපදිංචි වාහන 16 ක් පැවතුණි.	වාහන 16 ක ප්‍රමාණයක තොරතුරු ප්‍රවාහන අංශයේ නොමැති අතර එය පරීක්ෂා කරමින් පවතී.	දෙපාර්තමේන්තුව නමින් පවතින නමුත් භෞතිකව නොපවතින වාහන පිළිබඳ කඩිනමින් විමර්ෂණයක් කලයුතු වීම.
(ඇ)	දෙපාර්තමේන්තුවේ දැනට භාවිතා කරන වාහන 27 ක සහ අපහරණය සඳහා යෝජනා කර ඇති වාහන 25 ක නීත්‍යානුකූල හිමිකාරත්වය දෙපාර්තමේන්තුව සතුව නොතිබුණි.	මේවා පවරා ගැනීමට දීර්ඝකාලයක් ගතවන නමුත් වර්තමානය වන විට ඒ සඳහා ක්‍රියාමාර්ග ගෙන ඇති බව දන්වමි.	නීත්‍යානුකූල අයිතිය පවරා ගැනීමට කඩිනමින් කටයුතු කළ යුතු වීම.
(ඈ)	ගිණුම් අංශය විසින් රු. 69,310,000 කට ගිණුම් ගත කර තිබූ ප්‍රදේශ 6 ක පිහිටි අක්කර 176 රූඩ් 3 පර්චස් 39.5 ක් ගිණුම් තුල පැවති නමුත් දෙපාර්තමේන්තුව සතුව එවන් ඉඩම් කැබලි 6 ක් නොමැති බව පාලන අංශයේ ලබා දුන් තොරතුරු අනුව නිරීක්ෂණය විය.	ඉඩම් ප්‍රමාණ අතර පවතින වෙනස්කම් සම්බන්ධව ඔබගේ නිරීක්ෂණද, අභ්‍යන්තර විගණන විමසුම් වල නිරීක්ෂණ ද සම්බන්ධයෙන් දෙපාර්තමේන්තුව විසින් පරීක්ෂාවක් සිදුකිරීම සඳහා මණ්ඩලයක් පත් කිරීමට කටයුතු කර ඇත.	ගිණුම් අංශයේ සහ පාලන අංශයේ තොරතුරු අතර පවත්නා පරස්පරතා ඉවත්කර නිවැරදි තොරතුරු පවත්වා ගැනීමට කටයුතු කළ යුතු වීම.

(ඉ)	ගිණුම් අංශය විසින් රු. 198,846,000 කට ගිණුම් ගත කර තිබූ ප්‍රදේශ 4 ක පිහිටි ඉඩම් කැබලි 4 ක ප්‍රමාණය අක්කර 121 රූඩ් 2 පර්චස් 33.12 ක් ලෙස දක්වා තිබූ නමුත් පාලන අංශයේ තොරතුරු අනුව එම භූමි ප්‍රමාණය අක්කර 33 රූඩ් 2 පර්චස් 35.48 ක් වූ බැවින් අක්කර 88 ක පමණ වෙනසක් අංශ දෙකෙහි වාර්තා අතර පැවතුණි.	ඉඩම්වල භූමි ප්‍රමාණයන් අතර පවතින වෙනස්කම් සම්බන්ධව නිරීක්ෂණ පිළිබඳ සොයා බැලීමට මණ්ඩලයක් පත් කර කඩිනමින් පියවර ගන්නා බව.	ගිණුම් අංශයේ සහ පාලන අංශයේ තොරතුරු අතර පවත්නා පරස්පරතා ඉවත්කර නිවැරදි තොරතුරු පවත්වා ගැනීමට කටයුතු කළ යුතු වීම.
(ඊ)	ශ්‍රී පුර උප බලකාය පිහිටි රූඩ් 1 පර්චස් 28.4 ක ඉඩම ගිණුම් අංශය විසින් රු.513,000 කට ගිණුම්ගත කර තිබූ නමුත් පාලන අංශයේ තොරතුරු අනුව ශ්‍රී පුර උප බලකායේ ඉහත භූමි ප්‍රමාණය දක්වා නොතිබුණි.	පවතින වාර්තා ගත වී ඇති ඉඩම් නැවත භෞතිකව පරීක්ෂා කරන බවත්, ඉඩම් ප්‍රමාණ අතර පවතින වෙනස්කම් සම්බන්ධව ඔබගේ නිරීක්ෂණද, අභ්‍යන්තර විගණන විමසුම් වල නිරීක්ෂණ ද සම්බන්ධයෙන් දෙපාර්තමේන්තුව විසින් පරීක්ෂාවක් සිදුකිරීම සඳහා මණ්ඩලයක් පත් කිරීමට කටයුතු කර ඇති බව දන්වා සිටිමි.	ගිණුම් අංශයේ සහ පාලන අංශයේ තොරතුරු අතර පවත්නා පරස්පරතා ඉවත් කිරීමට කටයුතු කළ යුතු වීම.
(උ)	දීර්ඝ කාලයක සිට දිවයිනේ විවිධ ප්‍රදේශවල පිහිටි දෙපාර්තමේන්තුව පරිහරණය කරමින් පැවතුණු බිම් කැබලි 563 කින් බිම් කැබලි 32 කට අදාළ හෙක්ටයාර් 19.1421 ක ඉඩම් ප්‍රමාණයක් පමණක් පවරා ගැනීමට කටයුතු කර තිබූ අතර, ඉතිරි බිම් කැබලි 531 ක අයිතිය සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් පවරා ගැනීමේ කටයුතු අවසන්ව නොතිබුණි.	සමාලෝචිත වර්ෂය අවසන් වන විට ඉඩම් කැබලි 531 ක් අතරින් විධිමත්ව පවරාගත හැකි ඉඩම් 284 හඳුනාගෙන ඒවා පවරාගැනීමට අදාළ ආයතන හා සම්බන්ධීකරණයෙන් ක්‍රියාකරමින් පවතින බව දන්වමි.	දෙපාර්තමේන්තුව පරිහරණය කරනු ලබන ඉඩම්වල නීත්‍යානුකූල අයිතිය කඩිනමින් පවරා ගැනීමට කටයුතු කල යුතු වීම.

4.4 රජයේ නිලධාරීන් ඇප තැබීම

විගණන නිරීක්ෂණය	ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
මුදල් රෙගුලාසි 880 සහ 891 ප්‍රකාරව දෙපාර්තමේන්තුවේ ඇප තැබිය යුතු විධායක තනතුරු 07 කට හා ද්විතීයික තනතුරු 02 කට අදාළ නිලධාරීන් 73 ක් විසින් අදාළ ඇප තබා නොතිබුණි.	වර්තමානය වන විට ඇප තැබූ නිළධාරීන් ස්ථාන මාරු වී වෙනත් නිළධාරීන් අනුයුක්ත වී ඇති බව දන්වා සිටිමි. ඒ අනුව එම නිළධාරීන්ගෙන් මු.රෙ. 880 ප්‍රකාරව ඇප තැබීම් සිදුකර ගැනීමට මා විසින් උපදෙස් ලබා දී ඇති බව දන්වා සිටිමි.	මුදල් රෙගුලාසි ප්‍රකාරව ඇප තැබිය යුතු නිලධාරීන්ගෙන් ඇප ලබා ගැනීමට කටයුතු කළ යුතු වීම.

4.5 පාඩු හා හානි

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

	විගණන නිරීක්ෂණය	ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	මුදල් රෙගුලාසි 104 (3) ප්‍රකාරව පරිපූර්ණ වාර්තාවක් ඉදිරිපත් කිරීමට දින 07 කට වැඩි ප්‍රමාදයක් සිදුවේ යැයි අපේක්ෂා කරන්නේ නම් ප්‍රාරම්භක වාර්තාවක්ද, මුදල් රෙගුලාසි 104 (4) අනුව අලාභහානිය සිදු වූ දිනයේ සිට මාස 03 ක් ඇතුලත දී පූර්ණ වාර්තාවක්ද ඉදිරිපත් කල යුතු වුවත් දෙපාර්තමේන්තුවේ සිදුව තිබූ හානි හා පාඩු සිද්ධීන් 56 කට අදාල වාර්තා හා නිර්දේශයන් දින 60 ත් වර්ෂ 04 ත් අතර කාල පරාසයන් තුල ප්‍රමාද වී තිබුණි.	සියළුම හානි පාඩු සම්බන්ධව ඉදිරියේ දී මු.රෙ ප්‍රකාරව කඩිනමින් ක්‍රියාකිරීම සම්බන්ධව මා විසින් උපදෙස් ලබා දී ඇති බව ද ඔබ වෙත කාරුණිකව දන්වා සිටිමි.	ප්‍රමාද වී ඇති පරිපූර්ණ වාර්තා කඩිනමින් ලබා ගෙන නිර්දේශ ක්‍රියාත්මක කළයුතු වීම.
(ආ)	හානි හා පාඩු සිද්ධීන් 10 කට අදාළව මණ්ඩල වාර්තා අනුව වගකිව යුතු පාර්ශවයන්ගෙන් රු.6,295,433 ක් අයකර ගැනීමට නිර්දේශ කර තිබුණද සමාලෝචිත වර්ෂය අවසාන වන විටත් එම මුදල් අය කර ගැනීමට දෙපාර්තමේන්තුව අපොහොසත් වී තිබුණි.	අදාළ යුද්ධ හමුදා නිලධාරියාට විනයානුකූලව ක්‍රියා කරන ලෙසට යුද්ධ හමුදාව දැනුවත් කිරිමට කටයුතු සිදුකරමින් පවතී. ඒ අනුව අලාභය අයකර විනය කටයුතු සිදුකරමින් පවතී.	මණ්ඩල වාර්තා අනුව නිර්දේශිත මුදල් අයකර ගැනීමට කටයුතු කළ යුතු වීම.
(ඇ)	වැලිසර විශේෂ ව්‍යාපෘතිය මඟින් පවත්වා ගෙන ගිය පිටත බලකා වෙතින් වාර්තා කරන ලද භට පිරිස් සඳහා ආහාර ලබාදීමේ ක්‍රියාවලිය හා බලකා මඟින් නිෂ්පාදනය කරනු ලබන සහල්/ ධාන්‍ය අලෙවි කිරීමේ ක්‍රියාවලියේදී සිදු වූ විෂමතාව සම්බන්ධව කිසිදු සටහනක් හානි පාඩු ලේඛනයේ හෝ මූල්‍ය ප්‍රකාශනයෙහි ඇමුණුම ii හි ඇතුලත් කර නොතිබූ අතර එම මූල්‍ය අක්‍රමිකතාවය සිදුකල නිලධාරියාගෙන් රු.20,795,972 ක මුදලක් දෙපාර්තමේන්තුව වෙත අයකරගත යුතු නමුත් ඒ සම්බන්ධව කිසිදු ක්‍රියා මාර්ගයක් ගෙන නොතිබුණි.	වර්තමානය වන විට අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවට මේ සම්බන්ධව පරීක්ෂණයක් සිදු කිරිමට දන්වා, නීතිමය ක්‍රියාමාර්ග ගෙන ඇති බව දන්වමි.	අලාභයට වගකිවයුතු පාර්ශවයන් නිවැරදිව හඳුනාගත යුතු අතර මණ්ඩල වාර්තා අනුව නිර්දේශිත මුදල් අයකර ගැනීමට කටයුතු කළ යුතු වීම.

4.6 කළමනාකරණ දූර්වලතා

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

	විගණන නිරීක්ෂණය	ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	කටුනායක බලකායට අනුයුක්ත භටයින් 61 ක් ආගමික ස්ථාන 25 ක ඉදිකිරීම්, සුබ සාධක, රියදුරු සහ ආරක්ෂක කටයුතු වෙනුවෙන් යොදවා තිබුණි. ඉන් ආගමික ස්ථාන 12 ක්	ලිඛිත අනුමැතියක් නොමැතිව, කටුනායක බලකාය මගින් භට පිරිස් යොදවා ඇති විහාරස්ථාන 12 සඳහා වර්තමාන අවශ්‍යතාවය	නිසි අනුමැතියක් යටතේ හා අධීක්ෂණයකින් යුතුව නිශ්චිත කාල සීමාවක් සඳහා භටයින් වෙනත්

	සඳහා වසර 11 කට අධික කාලයක සිට හටයින් 30 ක් ලිඛිත අනුමැතියකින් තොරව සේවයේ යොදවා තිබුණි. තවද, ලිඛිත අනුමැතිය මත 2018 සිට ආගමික ස්ථාන සඳහා යොදවා තිබූ හටයින් 10 දෙනෙකුට අදාළව නිශ්චිත කාලසීමාවක් සඳහන් කර නොතිබුණි.	සමාලෝචනය කර, අත්‍යවශ්‍ය ස්ථාන සඳහා කෙටිකාලීන පදනම යටතේ ලිඛිතව අනුමැතිය ලබාදීමට මෙහෙයුම් අංශය වෙත උපදෙස් ලබා දී ඇති අතර මේ වන විට ඒ අනුව ක්‍රියාකරමින් පවතින බව දන්වමි.	රාජකාරී සඳහා යෙදවිය යුතු වීම.
(ආ)	විල්පත්තු බලකායේ හට පිරිස් අතුරින් හටයින් 129 ක් ආගමික ස්ථාන 58 ක් සඳහා පෙදරේරු කාර්මික, ජලනල කාර්මික, රියදුරු, ආරක්ෂක, ඉදිකිරීම් සහ සුහසාධන රාජකාරී සඳහා යොදවා තිබුණි. ඉන් ආගමික ස්ථාන 11 ක් සඳහා හටයින් 16 ක් යෙදවීමට පමණක් ලිඛිත අනුමැතීන් ලබාදී තිබූ අතර නිශ්චිත කාල සීමාවක් දක්වා නොතිබීම මත මාස 04 සිට වර්ෂ 05 ත් අතර කාල පරාසයක සිට එම ස්ථානවල රාජකාරී කර තිබුණි. තවද, ලිඛිත අනුමැතියකින් තොරව ආගමික ස්ථාන 47 ක් සඳහා 2015 වර්ෂයේ සිට හටයින් 113 ක් යොදවා තිබුණි.	වර්තමානය වන විට ලිඛිත අනුමැතියක් තාවකාලිකව ලබා දීමට ක්‍රියාකර ඇත. ආගමික ස්ථානවලට හට පිරිස්වල ශ්‍රමය ලබා දීම සම්බන්ධව රාජ්‍ය ගිණුම් කාරක සභාවේ දී සාකච්ඡා කරන ලද අතර, ඉදිරියේ දී ප්‍රතිපත්තිමය තීරණයක් ගැනීමට අපේක්ෂා කරන බව දන්වමි.	නිසි අනුමැතියක් යටතේ හා අධීක්ෂණයකින් යුතුව නිශ්චිත කාල සීමාවක් සඳහා හටයින් වෙනත් රාජකාරී සඳහා යෙදවිය යුතු වීම.
(ඇ)	කැබිතිගොල්ලෑව බලකායේ හටයින් 79 දෙනෙකු ආගමික ස්ථානවල ඉදිකිරීම්, සුභ සාධක සහ ආරක්ෂක රාජකාරි සඳහා කාල සීමාවක් නොදක්වා යොදවා තිබුණි. ඉන් එක් ස්ථානයක සුභ සාධන කටයුතු සඳහා යොදවා සිටි හටයින් තිදෙනෙක් වසර 17 කට අධික කාලයක සිට එකම ස්ථානයක සේවයේ යොදවා තිබුණි.	මෙම කරුණ සම්බන්ධයෙන් රාජ්‍ය ගිණුම් කාරක සභාවේ පවා සාකච්ඡාවට භාජනය වුවද, මෙතෙක් ප්‍රතිපත්තිමය තීරණයක් ගෙන නොමැති අතර, දීර්ඝ කාලීනව එම ස්ථානවලට අනුයුක්ත කර ඇති සිවිල් ආරක්ෂක සාමාජිකයින් ස්ථානමාරු කිරීමේ ප්‍රායෝගික දුෂ්කරතා පවතී. නමුත් මෙම සංවේදී ගැටළුව සඳහා පියවරෙන් පියවර ක්‍රියාමාර්ග ගන්නා බව සඳහන් කරමි.	නිසි අවසරයකින් හා අධීක්ෂණයකින් යුතුව සහ නිශ්චිත කාලසීමාවක් සඳහා ස්ථානමාරු ක්‍රමයද සලකා හටයින් වෙනත් රාජකාරී සඳහා යෙදවිය යුතු වීම.
(ඈ)	2006 සැප්තැම්බර් 13 දිනැති අංක 1462/20 දරණ අති විශේෂ ගැසට් පත්‍රයෙන් සහ 2015 මාර්තු 05 දිනැති අංක අමප/15/0089/610/003 දරන අමාත්‍ය මණ්ඩල පත්‍රිකාව මගින් රජය විසින් පවරා ඇති අමතර කාර්යයන්වලට පටහැනිව දෙපාර්තමේන්තුවට පවරා ඇති	රට තුල පැවති යුධමය වාතාවරණය අවසන් වීමත් සමඟ දුෂ්කර පාසල්වල ගුරු පුරප්පාඩු සඳහා එකී අධ්‍යාපන බලධාරීන්ගේ ඉල්ලීම අනුව මෙම සිවිල් ආරක්ෂක සාමාජිකයින් පාසල්වලට යොදවා ඇති බව දන්වා සිටිමි.	අමාත්‍ය මණ්ඩල තීරණ ප්‍රකාරව අනුමත රාජකාරී සඳහා පමණක් හටයින් අනුයුක්ත කිරීමට කටයුතු කළ යුතු වීම.

	රාජකාරී තුල නෙමැති වූ පාසල් ගුරු රාජකාරී සඳහා හොරොව්පතාන බලකායේ භටයන් 5 ක් ද, කැබිතිගොල්ලෑව බලකායේ භටයන් 26 ක් ද සහ විල්පත්තු බලකායේ භටයින් 18 ක් ද යොදවා තිබුණි.	වර්තමානය වන විටත් ගුරුපුරප්පාඩු පවතින බැවින් එම දුෂ්කර පාසල්වලින් මෙම සිවිල් ආරක්ෂක සාමාජිකයින් ගේ සේවය තවදුරටත් ලබා ගන්නා බව දන්වමි.	
(ඉ)	හොරොව්පොතාන බලකා භූමිය තුළ කළුවර, බුරුත, වීර, කෝං, වෙළං ආදී ගස් 500 කට අධික ප්‍රමාණයක් පැවති අතර එම ගස් අංක කර ලේඛන ගත කර ගිණුම් වල දැක්වීමට කටයුතු කර නොතිබුණි.	හොරොව්පොතාන බලකා මූලස්ථාන පරිශ්‍රයේ ඇති දැවමය වටිනාකමින් යුත් ගස් 500 ට අධික ප්‍රමාණය වෙන් වෙන් වශයෙන් වර්ග කර ඇති අතර, ඒවා අංක යොදා ලේඛණ ගත කිරීමට අවශ්‍ය කටයුතු සිදුකරමින් පවතී.	බලකා භූමිවල ඇති වටිනා දැව ගස් අංක කර ලේඛනගත කිරීමට හා මූල්‍ය ප්‍රකාශන තුල දැක්වීමට කටයුතු කළයුතු වීම.
(ඊ)	කැබිතිගොල්ලෑව බලකාය විසින් 2022 සහ 2023 වර්ෂ වලදී සුදු කැකුළු, කුරක්කන්, කව්පි, කෙසෙල්, අමු මිරිස්, කුරක්කන් පිටි, බණ්ඩක්කා, අමු මිරිස් මඤ්ඤොක්කා, වියලි මිරිස් යන අස්වනු කි.ග්‍රෑම් 1,020.6 ක්, ඉදල් 1,815 ක් සහ පොල් ගෙඩි 932 ක් සේවා වනිතා ඒකකයට ලබාදී තිබූ නමුත් සමාලෝචිත වර්ෂය අවසාන වන විටත් ඒ සඳහා මුදල් ගෙවා නොතිබුණි.	සේවා වනිතා ඒකකය වෙත භාර දී ඇති අයිතමයන් සම්බන්ධව සොයා බලා එම ගනුදෙනු කඩිනමින් නිරවුල් කරන ලෙස සේවා වනිතා ඒකකය වෙත උපදෙස් ලබා දී ඇති බව දන්වමි.	කඩිනමින් මුදල් අය කර ගැනීමට කටයුතු කළ යුතු වීම.
(උ)	අත්තිකාරම් ගිණුම් තුල පැවති මියගිය නිලධාරීන් 215 දෙනෙකුගෙන් අයවිය යුතු රු.7,760,450 ක ණය ශේෂ පැවති අතර, ඒ තුල නිලධාරීන් 12 දෙනෙකුගෙන් අයවිය යුතු වර්ෂ 5 ත් 10 ත් අතර පැරණි රු.1,361,027 ක ණය ශේෂ සහ නිලධාරීන් 4 දෙනෙකුගෙන් අයවිය යුතු වර්ෂ 3 ත් 5 ත් අතර පැරණි රු.384,630 ක ණය ශේෂ ඇතුලත් වී තිබුණි.	මියගිය නිලධාරීන් 215 අයවිය යුතු ණය විශ්‍රාම පාරිතෝශිතයෙන් අය කිරීම සඳහා විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව වෙත දැනුම් දී ඇති අතර, එම දෙපාර්තමේන්තුව විසින් අදාල ණය මුදල් පාරිතෝෂිතයෙන් අඩු කර ප්‍රේෂණය කිරීමෙන් අනතුරුව අදාල ශේෂය පියවා ගැනීමට කටයුතු කරන බව දන්වමි.	හිඟ ණය ශේෂ කඩිනමින් අයකර ගැනීමට කටයුතු කළ යුතු වීම.
(ඌ)	අත්තිකාරම් ගිණුම් තුල පැවති විශ්‍රාම ගිය නිලධාරීන් 159 දෙනෙකුගෙන් අයවිය යුතු රු.3,395,184 ක් වටිනා ණය ශේෂ පැවති අතර, එම ණය ශේෂ තුල නිලධාරීන් දෙදෙනෙකුගෙන් අය විය යුතු රු.237,799 ක් වසර 03 ත් 10 ත් අතර පැරණි ණය ශේෂ සහ	විශ්රාම ගිය නිලධාරීන් සම්බන්ධව පවතින ණය ශේෂ විශ්‍රාම පාරිතෝෂිකයෙන් අයකර ගැනීමට කටයුතු කරන බව දන්වමි.	හිඟ ණය ශේෂ කඩිනමින් අයකර ගැනීමට කටයුතු කළ යුතු වීම.

	නිලධාරීන් 74 දෙනෙකුගෙන් අය විය යුතු රු.1,794,470 ක් වසර 01 ත් 03 ත් අතර පැරණි ණය ශේෂ විය.		
(එ)	වැඩ තහනම් කරන ලද නිලධාරීන් 59 දෙනෙකුගෙන් අයවිය යුතු රු.1,569,229 ක් වටිනා ණය ශේෂ පැවති අතර, එම ණය ශේෂ තුල නිලධාරීන් 4 දෙනෙකුගෙන් අයවිය යුතු රු.460,460 ක් වටිනා වසර 03 ත් 10 ත් අතර පැරණි ණය ශේෂ සහ නිලධාරීන් 29 දෙනෙකුගෙන් අය විය යුතු රු.547,247 ක් වටිනා වසර 01 ත් 03 ත් අතර පැරණි ණය ශේෂ ද විය.	වැඩ තහනම් කර ඇති නිලධාරීන්ගේ පරීක්ෂණ කටයුතු අවසන් වීමෙන් අනතුරුව ඇතැම් නිලධාරීන් හට නැවත සේවය ලබා දීම සිදු කරන අතර ඔවුන්ගේ ණය මුදල අයකිරීමට කටයුතු කරනු ලබයි. කෙසේ වෙතත් අදාල නිළධාරීන් වෙත ණය මුදල් ශේෂ ගෙවීම් කරන ලෙස දන්වා, ලිපි යොමු කර ඇති බව දන්වමි.	හිඟ ණය ශේෂ කඩිනමින් අයකර ගැනීමට කටයුතු කළ යුතු වීම.
(ඒ)	සේවය අතහැර ගොස් තිබූ නිලධාරීන් 566 දෙනෙකුගෙන් අයවිය යුතු රු.27,662,877 ක් වටිනා ණය ශේෂ සමාලෝචිත වර්ෂය අවසන් වන විට අයකර ගැනීමට පැවති අතර, එම ණය ශේෂ තුල නිලධාරීන් 30 දෙනෙකුගෙන් අයවිය යුතු වර්ෂ 05 ත් 10 ත් අතර පැරණි රු.4,188,543 ක ණය ශේෂ සහ නිලධාරීන් 43 දෙනෙකුගෙන් අයවිය යුතු වර්ෂ 03 ත් 05 ත් අතර පැරණි රු.5,707,821 ක ණය ශේෂ පැවතුණි.	ණය ශේෂ කඩිනමින් අයකර ගැනීමට කටයුතු සම්පාදනය කර ඇති බව දන්වමි.	හිඟ ණය ශේෂ කඩිනමින් අයකර ගැනීමට කටයුතු කළ යුතු වීම.
(ඔ)	කැබිතිගොල්ලෑව බලකායේ ක්‍රියාත්මක හරිතාගාර මිරිස් ව්‍යාපෘතිය සඳහා 2021 සහ 2022 වර්ෂ වලදී බලකාය වෙත ලැබී තිබූ වටිනාකම රු.3,267,557 ක් වූ තොග අයිතම 19 ක් සහ වටිනාකම හඳුනාගත නොහැකි තොග අයිතම 22 ක් වර්ෂ 02 ත් 03 ත් අතර කාලයක සිට නිශ්කාර්යව පැවතුණි.	වර්තමානය වන විට එම අයිතම හැකිතාක් දුරට දෙපාර්තමේන්තු කටයුතු සඳහා උපයෝජනය කිරිමට කටයුතු කර ඇති බව දන්වමි. ඉතිරි අයිතමයන් ද අවශ්‍යතාවයන් ඇති ස්ථානවලට කඩිනමින් බෙදා හැරීමට උපදෙස් ලබා දී ඇත.	තොග අයිතම උපයෝජනය නොකිරීම පිළිබඳ විමර්ශනය කිරීම හා අදාළ අයිතමයන් ඵලදායී කාර්යයක් සඳහා යොදවා ගැනීමට කටයුතු කළ යුතු වීම.